ප්‍රහසන ශිල්පිනියක් වන නතාෂා එදිරිසූරිය විසින් ප්‍රහසන අංගයක් අතරතුර සිදු කළ බවට පැවසෙන ප්‍රකාශයකට, පසු ගිය දින වල සමාජ මාධ්‍ය තුළ විශාල අවධානයක් යොමු වී තිබිණි.
මේ අතර, එසේ ආන්දෝලනාත්මක ප්‍රකාශයක් කිරීමේ චෝදනාව මත, නතාෂා එදිරිසූරිය ව කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේදී මැයි 28, 2023 දින අත්අඩංගුවට ගැනීමේ සිදුවීම ද, මාධ්‍ය තුළ ප්‍රමුඛ අවධානයක් ලබාගත් පුවතක් වූ බව නිරීක්ෂණය කළ හැකි විණි.
මේ සම්බන්ධයෙන්, මැයි 28, 2023 දින රූපවාහිනී රාත්‍රී සිංහල ප්‍රධාන පුවත් විකාශයන් හි සිරස්තල තුළ ඉදිරිපත් වී තිබූ ආකාරය මෙසේ දැක්විය හැක.
මේ පිළිබඳව අපගේ නිරීක්ෂණයන් මෙසේ දැක්විය හැක.
* බොහෝ සිරස්තල ඔස්සේ, සැක පිට අත්අඩංගුවට ගැනුණු නතාෂා එදිරිසූරිය, එම චෝදනා එල්ල වී ඇති වරද නිශ්චිතවම සිදු කළ බව දක්වයි.
* එක් සිරස්තලයක් ඔස්සේ, ඇය එම චෝදනා එල්ල වී ඇති වරද සම්බන්ධයෙන් සැක පිට පමණක් අත්අඩංගුවට ගැනී ඇති බව දක්වයි.
1) නීතිමය ක්‍රියාවලියක් ඔස්සේ වරදකරුවෙකු බවට තහවුරු වී නැති, යම් චෝදනාවක් පිළිබඳව සැකපිට පමණක් අත්අඩංගුවට ගැනී ඇති අයෙකු, වරදකරුවෙකු ලෙසින් හුවා දැක්වීම කෙතරම් මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල ද?
2) මෙම සිදුවීමේ ස්වභාවය සහ සමාජ මාධ්‍ය ඔස්සේ ඊට ලැබුණු අවධානයත් සමඟ බලන විට, එය මාධ්‍ය විසින් සැක පිට පමණක් අත්අඩංගුවට ගත් අයෙකු දුෂ්ටත්වයකින් දැක්වීමක් (Demonisation) සහ, වරදකරුවෙකු බවට මාධ්‍ය විසින් තීන්දුවක් ලබාදීමක් (Trial by media) නොවන්නේ ද?
(YouTube වෙත එක් කොට තිබූ, මැයි 28, 2023 දින රූපවාහිනී රාත්‍රී සිංහල ප්‍රධාන පුවත් විකාශයන් හි සිරස්තල ඇසුරිණි.)
** පහත සඳහන් ජාතික රූපවාහිනී නාලිකාවේ ප්‍රධාන ප්‍රවෘත්ති විකාශය රාත්‍රී 6:50 නොව රාත්‍රී 8 ලෙස නිවැරදි විය යුතු බව කරුණාවෙන් සලකන්න.

# නතාෂා එදිරිසූරිය අත්අඩංගුවට ගැනීම රූපවාහිනී පුවත් සිරස්තල ඇසින්

6:30 pm — **බුදුන්ට අපහාස කර** රටින් පනින්න හැදු නතාෂා කටුනායකින් CID යට.

6:50 pm — **සිදුහත් චරිතයට අපහාස කළ** නතාෂා එදිරිසූරිය නමැත්තිය අත්අඩංගුවට.

6:55 pm — **බුදු දහමට අපහාස කළ** නතාෂා එදිරිසූරිය රට පනිද්දී CIDයට කොටු වෙයි. මෝඩාභිමානයේ පිටපත සොයා නතාෂා නිවසට රැගෙන යයි.

6:55 pm — **බුදුන්ට හා බෞද්ධ සංස්කෘතියට අවමන් කර** රටින් පලා යාමට තැත් කළ නතාෂා අත්අඩංගුවට.

6:00 pm — **බුදු දහමට නිගරු කර,** රට පනින්න ගිය නතාෂා CID අත්අඩංගුවට.

8:00 pm — **බෞද්ධ සාහිත්‍යයට අපහාස කළ** කාන්තාව රට පනින්න යද්දී අත්අඩංගුවට, කාන්තාවගේ ප්‍රකාශයට පාර්ශව රැසකින් තවදුරටත් විරෝධය.

7:00 pm — ආන්දෝලනාත්මක ප්‍රකාශයක් හේතුවෙන් අත්අඩංගුවට ගත් නතාෂාගෙන් තවදුරටත් ප්‍රශ්න කෙරේ.

මැයි 28, 2023 දින තෝරාගත් රාත්‍රී සිංහල ප්‍රධාන පුවත් ඇසුරිණි